**23-06-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබේ පළමු පාඩම මා ජීවාත්මයකි, ශරීරයක් නොවේ. ජීවාත්ම විඥාණය තබා ගත් විට, පියා සිහිකිරීමේ හැකියාව ලැබේ.

**ප්‍රශ්නය:** ලෝකයේ මිනිසුන්ට නැති ඔබට තිබෙන අදෘෂ්‍යමාන ධන නිධානය කුමක් ද?

**පිළිතුර:** පරමාත්ම පියා වන පරමාත්ම දෙවියන් උගන්වයි, යන්න ගැන දැනුවත් වෙමින් සතුටේ අදෘෂ්‍යමාන නිධානය ඔබට ඇත. ඔබ දන්නවා, මෙම වත්මන් අධ්‍යයනය ඔබේ අමරණීය දේශයේ අනාගතයටයි, මෙම මරණයේ දේශයට නොවේ. පියා මෙසේ කියයි : උදේ පාන්දරින් නැගිට ඇවිදීමට හෙම ගියා වුණත් පළමු පාඩම සිහිපත් කරගෙන දිගටම සතුට ලබා ගන්න.

ඕම් ශාන්ති. පියා ඔබ දරුවන්ගෙන් මෙසේ අසයි දරුවනි, ඔබ ජීවාත්ම විඥාණයෙන් සිටිනවා ද? ඔබ මෙහි හිඳින ගමන් හැම කෙනෙක් ම ජීවාත්මයක් ලෙස සලකනවාද? උත්තරීතර ජීවාත්මය වන පියා ඔබට උගන්වයි. ඔබ දරුවන් දැන් දැනුවත් ව සිටිනවා ඔබ ජීවාත්ම මිස ශරීර නොවන බව. ඔබ ජීවාත්ම අවධානයට පැමිණීමට උත්සාහයක් කළ යුතුව ඇත. දරුවන්ට ආත්ම විඥානයෙන් සිටීමට හැකියාවක් නැත. ඔවුන් නැවත නැවත ශරීර අවධානයට පැමිණේ. ඒ නිසයි බාබා මෙසේ අසන්නේ ඔබ මේ සිටින්නේ ආත්ම විඥාණය සහිතවද? ඔබ ආත්ම විඥාණයෙන් සිටී නම් ඔබට පියා සිහිකළ හැකි වේ. ඔබ ශරීර විඥාණය ඇති ව සිටී නම් ඔබේ භෞතික නෑදැයින් සිහි වේ. පළමුවෙන් ම 'මම ආත්ම විඥාණයකි' යන වචන සිහිකරන්න. මේ ජීවාත්මයේ උපත් 84 ක වාර්තාව ඇතුළත් ය. නිශ්චිතවම සලකන්න මා වූ කලී ජීවාත්මයකි. ඔබ කල්ප භාගයක් ම ශරීර අවධානයෙන් සිට ඇත. දැන් මේ සංගම් යුගයේ දී ජීවාත්ම අවධානයට ගෙන ඇත. ඔබ ශරීරයක් සේ සැලකුවොත් පියා සිහි කිරීමට නොහැකිය. එමනිසා, මෙම පාඩම නිශ්චිත කර ගන්න මෙම ජීවාත්මය වන මා අසීමිත පියාගේ දරුවෙකි. ඔබේ ශරීරයේ පියා සිහිකිරීමට ඔබට උගන්වන්නේ නැත. පියා මෙසේ කියයි දැන් ඔබේ පාරලෞකික පියා වන මා සිහි කරන්න. ආත්ම විඥාණයට පත් වෙන්න. ශරීර අවධානයෙන් සිටීමෙන් ඔබ ශාරීරික නෑදැයින් සිහි කරයි. උත්සාහය, අවසානයේ ඔබ ජීවාත්මයක් ලෙස සලකන පියා සිහිකිරීමටයි. මේ සියල්ල විස්තර කරන්නේ කවුද? සියලු ජීවාත්මයන් වන අපගේ පියාය. සියලු දෙනා සිහිකරමින් මෙසේ යාඥා කරන්නේ ඔබටය 'බාබා, එන්න! පැමිණ අපව මේ දුකින් මුදා ගන්න!' ඔබ දරුවන් දන්නවා, මෙම අධ්‍යයනය තුළින් අනාගතයේ දී ඔබ ඉතා ඉහළ තත්ත්වයක් ලබන බව. ඔබ දැන් සිටින්නේ. ඉතාමත් ම සුබදායක සංගම් යුගයේ ය. ඔබට තවත් මේ මරණයේ දේශයේ සිටීමේ අවශ්‍යතාවයක් නැත. ඔබේ මෙම ඉගෙනුම අනාගත උපත් 21 සඳහාය. අපි ඉගෙන ගන්නේ අමරණීය දේශය ඇති සත් යුගයටයි. අමරණීය පියා අපට මෙම ඥානය දෙයි. ඒ නිසා, ඔබ මෙහි සිටින විට පළමුවෙන්ම ඔබ ජීවාත්මයක් ලෙස සලකමින් ජීවාත්මයක් ලෙස සිහි එළවාගෙන ඔබේ පාප දුරු කර ගන්න. ඔබ දැන් ඉන්නේ සංගම් යුගයේ ය. බාබා අපව මිනිසුන් අතර ඉහළම තත්ත්වයට පත් කරවයි. ඔහු මෙසේ කියයි මා සිහි කළ විට ඔබ ඉහළම මනුෂ්‍යයින් බවට පත් වේ. බාබා අපව සියලු මනුෂ්‍යයින් අතර ඉහළම තත්ත්වයට නංවයි. ඔහු මෙසේ කියයි මා සිහි කර උසස් මනුෂ්‍යයින් වන්න. මා පැමිණියේ මනුෂ්‍යයින් දෙවි දේවතාවන් බවට පත් කිරීමටයි. සත් යුගයේ දී ඔබ දෙවි දේවතාවන්ව සිටියහ. ඔබ දැන් දන්නවා ඔබ ඉණිමගේ පහළට ආවේ කෙසේ ද කියා. අපේ ජීවාත්ම තුළ උපත් 84 ක චරිත කොටස් ඇතුළත් වී ඇත. ලෝකයේ වෙන කිසිවෙක් මෙය නොදනී. එම භක්ති මාර්ගය මෙම ඥාන මාර්ගයෙන් බොහෝ පැහැදිලි ලෙස වෙනස්ය. පියා උගන්වන ජීවාත්ම පමණයි මේ සියල්ල දන්නේ, වෙන කිසිවෙක් නොදනී. මේ අදෘෂ්‍යමාන ධනය අපේ අනාගතය සඳහාය. ඔබ ඉගෙන ගන්නේ අමරණීය දේශයටයි, මෙම මරණීය දේශයට නොවේ. පියා මෙසේ කියයි උදේ පාන්දරින් නැගිට ඇවිදීමට හෙම ගියා වුණත් පළමු පාඩම සිහිපත් කරගෙන දිගටම සතුට ලබා ගන්න මා ජීවාත්මයකි, මේ ශරීරය මා නොවේ. අපේ ආධ්‍යාත්මික බාබා අපට උගන්වමින් සිටී. මේ දුක් ලෝකය දැන් වෙනස් විය යුතුව ඇත. සතුටේ ලෝකය වූ කලී සත් යුගයයි. මේ සියලු ඥානය දැන් ඔබේ බුද්ධිය තුළ ඇත. මෙය ආධ්‍යාත්මික ඥානයයි. ඥාන සාගරය වන පියා ආධ්‍යාත්මික පියා වේ. ඔහු අශරීරික අයගේ (ජීවාත්මයන්ගේ) පියාය. අන් සියලු සබඳකම් ශරීරයේ සබඳකම් ය. දැන් සියලු ශරීර සබඳතා අතහැර එකම කෙනාට ඔබේ සම්බන්ධය ඇති කර ගන්න. මිනිසුන් මෙසේ ගායනා කරයි මගේ වන්නේ එකම කෙනෙකි, වෙන කිසිවෙක් නැත. අප සිහි එළවා ගන්නේ එකම පියා පිළිබඳවයි. අප මේ ශරීර පිළිබඳවවත් සිහියට නොගනී. මේ වියපත් ශරීර අත්හල

යුතුව ඇත. ශරීරය හලන ඥානය ද ඔබට ලැබේ. සිහි එලවාගෙන සිටින විට ශරීරය අතහැරිය යුතු වේ. මේ නිසයි බාබා මෙසේ කියන්නේ ජීවාත්ම අවධානයට පත් වන්න. මෙය ඔබ තුළට ඇතුල් කර ගත යුතුයි. දිගින් දිගටම වෘක්ෂයේ බීජය වන පියා සිහිකරන්න. ආගමික ලේඛන තුළ කල්ප වෘක්ෂය පිළිබඳව සටහන්ව ඇත. ඔබ දරුවන් දන්නවා ඥාන සාගරය වන පියා උගන්වන බව. ඔබට උගන්වන්නේ මනුෂ්‍යයෙක් නොවේ. මෙය නිෂ්චිතවම තබා ගන්න. ඔබ අධ්‍යයනය කළ යුතුයි. සත් යුගයේ දී පවා ඔබට උගන්වන්නේ ශාරීරික අයයි. මෙහිදී මේ අය ශාරීරික කෙනෙක් නොවේ. ඔහු මෙසේ කියයි වියපත් ශරීරයක සහය ලබා ගෙන ඔබට උගන්වමි. මම හැම චක්‍රයකම ඔබට උගන්වන අතර ඊළඟ චක්‍රයේ ද පැමිණ නැවත උගන්වමි. දැන් මා සිහි කළ විට පව් දුරු වේ. මම පාරිශුද්ධ කරුවා වෙමි. මා හඳුන්වන්නේ සර්ව බලධාරී අධිකාරීත්වය ලෙසය. කොහොමනමුත්, මායා ද සුළු පටු නොවේ. ඇය ද බලවත් ය. බලන්න ඇය ඔබව පහළ දැම්මේ කොහි සිට ද කියා. ඔබට මේ සියල්ල සිහිගන්වා ගත හැකියි නේද? උපත් 84 චක්‍රයද සිහිගන්වා ගන්න. මෙය මිනිසුන්ට අදාළ වන්නකි. බොහෝ මිනිසුන් මෙසේ අසයි සතුන්ට සිදුවන්නේ කුමක් ද? කොහොමනමුත්, මෙහි ඇත්තේ සතුන් පිළිබඳ කරුණක් නොවේ. පියා කතා කරන්නේ ඔහුගේ දරුවන්ට පමණි. පිට අය පියා ගැන දන්නේ ද නැත. ඉතින් ඔවුන්ට කතා කරන්නේ මොනවාද? සමහර අය කියනවා ඔවුන්ට බාබා මුණගැසිය යුතුයි කියා. කොහොමනමුත්, ඔවුන් ඔහුව නොදන්නා විට ඔහේ හිඳගෙන විවිධ මාදිලියේ වැරදි ප්‍රශ්න අසයි. දවස් හතේ පාඨමාලාව ලබා ගැනීමෙන් පසුවත් සමහර අය සම්පූර්ණයෙන් දන්නේ නැහැ ඒ අපේ අසීමිත පියා කියා. බොහෝ පැරණි භක්තිවන්තයින්, බොහෝ භක්ති කළ අය මේ සියලු ඥාන කරුණු ඔවුන්ගේ බුද්ධිය තුළ තබා ගනී. භක්තිය අඩුවෙන් කළ අය තුළ තබා ගත හැක්කේ සුළු ප්‍රමාණයක ඥානයක් පමණි. ඔබලා සැමටම වඩා පැරණි භක්ති වන්තයින්ය. කිසිවෙක් නොදන්නා නමුත්, සමරණු ලබන්නේ පියා පැමිණෙන්නේ භක්තියේ ඵලය ප්‍රදානය කිරීමට කියාය. භක්ති මාර්ගය මුළුමනින්ම ඥාන මාර්ගයෙන් පරිබාහිරය. මුළු ලෝකයම භක්ති මාර්ගය තුළ සිටී. මිලියන බොහෝ ගණනකින් මෙහි පැමිණ ඥානය හදාරන්නේ අතලොස්සක් පමණි. විස්තර කිරීම ඉතා මිහිරිය. උපත් 84 චක්‍රය අවබෝධ කර ගත හැක්කේ මනුෂ්‍යයින්ට පමණි. කලින් ඔබද කිසිවක් නොදනී. ඔබ ශිවාවත් දැන නොසිටියේය. ශිවාට බොහෝ සිද්ධස්ථාන බිහිවී ඇත. මිනිසුන් ශිවාට වන්දනාමාන කළත් මල් පූජා කළත් නමස්කාර කළත් ඔහුට වන්දනා කරන්නේ ඇයි දැයි ඔවුන් නොදනී. ලක්ෂ්මි සහ නාරායන්ට වන්දනා කරන්නේ කුමක් නිසාදැයි වත්, ඔවුන් කොහෙ ගියා ද කියා වත් ඔවුන් දන්නේ නැත. භාරත්වාසීන් පමණි නොදන්නේ ඔවුන්ගේ වන්දනාවට සුදුසු වන්නේ කවුද කියා. කිතුණුවන් දන්නවා ක්‍රිස්තුස්වහන්සේ අහවල් අවුරුද්දේ පැමිණ අහවල් ආගම ස්ථාපනය කළා කියා. ශිව බාබා ගැන කිසිවෙක් නොදනී. ශිවා පමණි පාරිශුද්ධකරුවා ලෙස හඳුන්වන්නේ. ඔහු පමණි ඉහළ ම ඉහළ. මිනිසුන් බොහෝ සෙයින් වන්දනා කරන්නේ ඔහුය. ඔහු සියලු දෙනාගේ ගැලවුම ලබා දුන් අයයි. බලන්න ඔහු ඔබට උගන්වන ආකාරය. ඔබ පියාට අඬගැසුවේ පැමිණ ඔබව පිරිසිඳු කරන්න කියාය. මිනිසුන් සිද්ධස්ථාන වලදී ඉතා ඉහළින් වන්දනාමාන උත්සව පවත්වයි. ඔවුන් බොහෝ වියපැහැදම් ද කරයි. ශ්‍රීනාථ හා ජගත්නාථ සිද්ධස්ථාන වලට ගොස් මෙය බලා ගන්න. ඒ දෙකම එක විදියයි. ජගත්නාථ සිද්ධස්ථානයේ බත් හැලියක් පිළියෙල කරයි. ශ්‍රීනාථ හිදී බොහෝ දෑ යෙදූ පෝෂ්‍යදායී ආහාර ලබා දේ. ඇයි මේ වෙනස ? ඊට හේතුවක් තිබිය යුතුයි. ශ්‍රීනාථ සහ ජගත්නාථ යන දෙකෙහිම ප්‍රතිමා කැටයම් කර ඇත්තේ කළු ගලෙනි. ඔවුන්ට මීට හේතුව පිළිබඳ කිසිඳු අවබෝධයක් නැත. ඔබ කියන්නේ ජගත්නාථ හි ලක්ෂ්මි නාරායන් සිටිනවා කියාද? රාධෙ ක්‍රිෂ්ණා සිටිනවා කියාද? රාධෙ ක්‍රිෂ්ණා හා ලක්ෂ්මි නාරායන් පිළිබඳ කිසිවකුට අවබෝධයක් නැත. ඔබ දරුවන් දැන් දන්නවා, ඔබ වන්දනීය වූ දෙවි දේවතාවුන් බවත් දැන් වන්දනා කරුවන් වී සිටින බවත්. ඔබ මුළු චක්‍රය පුරාම සිට ඇත. ඔබ දැන් නැවතත් දෙවි දේවතාවුන් බවට පත් වීමට ඇඟිලි ගනිමින් සිටී. ඔබට මෙය උගන්වන්නේ මනුෂ්‍යයෙක් නොවේ. මේවා දේව වාක්‍ය වේ. දෙවියන් වූ කලී ඥාන සාගරයයි. මෙහි සිටින්නේ ඥාන සාගරය වූ පියා සිහි කරනා භක්ති සාගරයන් පමණි. ඔබ අපිරිසිඳු බවට පත් වී ඇත. ඒ නිසා ඔබ නියත වශයෙන් ම නැවත පිරිසිඳු බවට පත් විය යුතුය. මෙය අපිරිසිඳු ලෝකයයි. මෙය දිව්‍ය ලෝකය නොවේ. පාරාදීසය ඇත්තේ කොහෙදැයි කිසිවෙක් නොදනී. ඔවුන් කියනවා, ‘අහවලා පාරාදීසයට ගියා‘ කියා. ඉතින් ඇයි ඔවුන් බමුණෙක් හරහා අපායේ කෑම ඔහුට දෙන්නේ. සත් යුගයේ විවිධ වර්ග වල මල් සහ පළතුරු ඇත. මෙහි ඇත්තේ මොනවාද? මේ අපායයි. ඔබ දන්නවා දැන් බාබා අනුසාරයෙන් ඔබ දෙව්ලොව වාසීන් වීමට උත්සාහ කරන බව. ඔබ අපිරිසිඳු බවේ සිට පිරිසිඳු බවට පත් වේ. පියා මීට මාර්ගය පෙන්වා දෙයි. පියා හැම චක්‍රයකම මේ මාර්ගය හොඳට පෙන්වා දෙයි. මා සිහිකර ඔබේ පව් දුරු කර ගන්න. ඔබ දන්නවා ඔබ දැන් සිටින්නේ ඉතාමත් සුබදායී සංගම් යුගයේ බව. ඔබ මෙසේ කියයි බාබා, අවුරුදු 5000 කට ඉහත ද අප මෙසේ ආවෙමු. ඔබ දන්නවා බාබා ඔබට සැම චක්‍රයකදීම අමරණීයත්වයේ කතාන්තරය කියන බව සහ අසන

බව. බාබා අමරණීයත්වයේ ස්වාමියා වේ. කොහොමනමුත්, ඔහු වාඩි වී පාර්වතීට කතාන්තරය කියා නැත. ඒ භක්තියයි. ඔබ දැන් දන්නවා ඥානය යනු කුමක් ද, භක්තිය යනු කුමක් ද කියා. බ්‍රහ්මණ දහවල සහ බ්‍රහ්මණ රාත්‍රිය ඇත. පියා මෙසේ විස්තර කරයි ඔබ බ්‍රහ්මිණ්වරුය, ආදී දේව් ද බ්‍රාහ්මණයෙකි. ඔබ දේවතාවෙක් යැයි නොකියයි. මිනිසුන් ආදී දේව් පිළිමය බලන්නට යයි. දිව්‍යාංගනාවන්ට විවිධ ආකාරයේ නම් ඇත. ඔබව සිහිපත් කරන්නේ ඔබ විශාල සේවයක් කර ඇති නිසාය. පාපයෙන් තොර වූ භාරතය ඉන්පසු පාපකාරී විය. එය දැන් රාවණ් රාජ්‍යය වී ඇත. ඔබ දරුවන් ඉහළම මිනිසුන් වන්නේ මෙම සංගම් යුගයේ දීය. ඔබ මත අවිනාශී බ්‍රහස්පති වාසනාව ඇත. ඉනික්බිතිව ඔබ අමරණීය දේශයේ හිමිකරුවන් වේ. පියා ඔබව මනුෂ්‍ය බවේ සිට දේවතාවුන් කරවීම සඳහා උගන්වමින් සිටී. දෙව්ලොව හිමිකරුවන් වනවා යනු ඔබ මත බ්‍රහස්පති ඵලය ඇති බවයි. ඔබ නියත වශයෙන්ම අමරණීය දේශය වන දෙව්ලොවට යයි. කොහොමනමුත්, ඔබ අධ්‍යයනය කරන අතරතුර පලාඵල සසල වේ. ඔබට සිහි එළවා ගැනීම සම්පූර්ණයෙන් අමතක වේ. පියා ඔබට මෙසේ කියා ඇත මා සිහිකරන්න! ගීතාවේ මෙසේ කියා ඇත ‘දෙවියන් කතා කරයි කාම රාගය ලොකුම සතුරාය.‘ මිනිසුන් ගීතාව හැදෑරුවත් එම පාපය ජය ගන්නේ නැත. දෙවියන් මෙය කීවේ කවදාද? අවුරුදු 5000 කට පෙරදිය. දැන් නැවතත් දෙවියන් කතා කරයි රාගය ලොකුම සතුරාය. එය ජය ගන්න! එය ඔබට මුල දීත් අතරමැද දීත් අවසානයේ දීත් දුක්ඛය ගෙන දෙයි. ප්‍රධාන පාපය රාගයයි. මේ නිසයි සැවොම අපිරිසිඳු යැයි කියන්නේ. ඔබ දැන් දන්නවා මේ චක්‍රය කැරකෙන ආකාරය. නාටකය අනුව අපි අපිරිසිඳු වන විට පියා පැමිණ අපව පිරිසිඳු කරයි. බාබා නැවත නැවත මෙසේ කියයි පළමුවෙන්ම ඇල්ෆා කියන දේ සිහි කරන්න. ශ්‍රීමත් පිළිපැදීමෙන් පමණි ඔබට උසස් විය හැක්කේ. ඔබ අවබෝධ කරගෙන සිටිනවා පෙරදී ඔබ උසස්ව සිට දැන් පිරිහී ඇති බව. දැන් ඔබ නැවත වතාවක් උසස් වීමට උත්සාහ දරමින් සිටී. දිව්‍යමය ගුණාංග උකහා ගන්න! කිසිවෙක් අසතුටට පත් නොකරන්න! සෑම කෙනකුටම මාර්ගය පෙන්වීම දිගටම කරන්න! පියා මෙසේ කියයි මා සිහිකළ විට ඔබේ පව් කැපී යයි. ඔබ මට පමණි පාරිශුද්ධකරුවා යැයි කියන්නේ. පාරිශුද්ධකරුවා පැමිණ සැවොම පිරිසිඳු කරන්නේ කෙසේ දැයි කිසිවෙක් නොදනී. චක්‍රයකට පෙරද පියා මෙසේ කීවේය මා පමණක් ම නිරතුරුව සිහි කරන්න! මේ යෝගා ගින්නෙන් පමණි ඔබේ පව් පුළුස්සා දැමිය හැක්කේ. පිටස්තර කිළිටු ඉවත් කළ විට ජීවාත්මය පිරිසිඳු බවට පත් වේ. රත්තරන් වලට බාහිර දේ මිශ්‍ර වී ඇත. ඒ නිසා ඉන් සාදන ආභරණ ද එසේ ම වේ. පියා ඔබට දැන් තේරුම් කර දී ඇත්තේ ජීවාත්ම පිටස්තර දේ හා මිශ්‍ර වන ආකාරය ගැනය. ඒවා ඉවත් කළ යුතුව ඇත. නාටකය තුළ පියාගේ කොටස වන්නේ මෙහි පැමිණ ඔබ දරුවන් ජීවාත්ම අවධානයට පත් කිරීමයි. ඔබ පිරිසිඳු බවට පත් විය යුතුමය. ඔබ දන්නවා සත් යුගයේ දී ඔබ වෛශ්නව් බව. එය පිරිසිඳු පවුල් ආශ්‍රමය විය. දැන් අපි පිරිසිඳු වෙමින් විෂ්ණු දේශයේ හිමිකරුවන් බවට පත් වෙමු. ඔබ ද්විත්ව වෛශ්නව් බවට පත් වේ (පාරිශුද්ධිය සහ නිර්මාංශ බව). සැබෑ වෛශ්නව් වන්නේ ඔබය. ඔවුන් අයත් වන්නේ පාපකාරී ආගමටයි. ඔබ අයත් වන්නේ පාපයෙන් තොර වෛශ්නව් ආගමටයි. පළමුව ඔබ පියා සිහි කරන අතර දෙවනුව පියා ලබා දෙන ඥානය උකහා ගන්න. ඔබ රජවරුන්ගෙත් රජවරු බවට පත් වේ. ඒ මිනිසුන් රජවන්නේ එක උපතක කෙටි කාලයකට පමණි. ඔබේ රාජධානිය පරම්පරා 21 ක් පුරා එනම්, සම්පූර්ණ යුගයක් පුරා විහිදෙනු ඇත. එහි අකල් මරණ ඇත්තේ ම නැත. ඔබ දැන් මරණය ජය ගනිමින් සිටී. කාලය පැමිණි විට ඔබ අවබෝධයෙන් යුතුව සිට ඔබේ පරණ ශරීරය අතහැර අළුත් එකක් ලබා ගනී. ඔබට එය දර්ශනය වේ. සතුට සමරා සංගීත කණ්ඩායම් වාදනය කරාවි. ඔබේ තමෝප්‍රධාන් ශරීරය අතහැර සතෝප්‍රධාන් ශරීරයක් ලබා ගැනීම මහා සතුටට කාරණයකි. එහි දී සාමාන්‍ය ජීවන කාලය අවුරුදු 150 කි. මෙහි දී සැවොම පාපයේ ගැලෙන නිසා අකල් මරණ තිබේ. නිවැරදිම යෝග ඇති දරුවන්ට එම යෝග බලයෙන් සියලු භෞතික ඉන්ද්‍රියන් පාලනය කළ හැකිය. ඔබ සම්පූර්ණ යෝග තුළ සිටින විට ඔබේ භෞතිත ඉන්ද්‍රියන් සිසිල් වේ. සත් යුගයේ දී ඔබේ කිසිම භෞතික ඉන්ද්‍රියක් ඔබව රවටන්නේ නැත. එහිදී කිසිසේත්ම ඔබේ භෞතික ඉන්ද්‍රියන් පාලනයෙන් තොර යැයි නොකියැ වේ. ඔබට ලැබෙන්නේ ඉහළම තත්ත්වයයි. මෙය හඳුන්වනුයේ අවිනාශී බ්‍රහස්පතී වාසනා ඵලය ලෙසයි. පියා වෘක්ෂයේ ස්වාමියා වන අතර මනුෂ්‍ය ලෝක වෘක්ෂයේ බීජය වේ. බීජය ඉහළ නිසා ඔබ ඔහු ගැන සිහි එළවීම ද ඇත්තේ ඉහළය. ජීවාත්මය ඔහුගේ පියා සිහිපත් කරයි. ඔබ දරුවන් දන්නවා අසීමිත පියා ඔබට උගන්වන බව. ඔහු එක් වතාවක් පමණක් පැමිණ අමරණීයත්වයේ කතාව අපට කියයි. ඔබ එයට අමරණීයත්වයේ කතාන්තරය හෝ සත්‍ය නාරායන්ගේ කතාව ලෙස හැඳින් වුවද මිනිසුන් ඒ කතාවල තේරුම නොදනී. සත්‍ය නාරායන් ගේ කතාවට ඇහුම්කන් දීමෙන්, ඔබ සාමාන්‍ය මිනිසා සිට නාරායන් බවට පත් වේ. අමරණීයත්වයේ කතාවට ඇහුම්කන් දීමෙන් ඔබ අමරණීයත්වයට පත් වේ. බාබා සියල්ල ඉතා පැහැදිලිව විස්තර කරයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. යෝගා බලයෙන් ඔබේ සියලු භෞතික ඉන්ද්‍රියන් පාලනය කරන්න. වෘක්ෂයේ ස්වාමියා වන පියා ගැන සිහි එලවාගෙන සිටින්න. සැබෑ වෛශ්නව් කෙනෙකු බවට පත් වන්න, එහි තේරුම පිරිසිඳු බවට පත් වීමයි.
2. උදේ පාන්දරින් ම අවදිව පළමු පාඩම ස්ථිර කරගන්න : මම ජීවාත්මයකි, ශරීරයක් නොවේ. අපගේ ආධ්‍යාත්මික පියා අපට උගන්වයි. මේ දුක් ලෝකය වෙනස් විය යුතුව ඇත. මෙසේ සියලු ඥානය මතගා ගැනීමට දිගටම බුද්ධිය යොදා ගන්න.

**වරදානය:** ඔබ කෝටි ගණනින් වාසනාවන්ත වී සෑම නිධානයක්ම භාවිත කිරීමෙන් කෝටි ගණන් ආදායමක් රැස් කරගනිත්වා.

නාටකයට අනුව, සෑම තත්පරයකම කෝටි ගණන් ආදායමක් රැස් කර ගැනීමේ ආශිර්වාදය ලැබෙන්නේ සංගම යුගයේදීය. එවැනි ආශිර්වාදයක් ඔබ වෙනුවෙන් භාවිත කර අන් අයට ද පරිත්‍යාග කරන්න. ඒ හා සමානව, සිතිවිලි නිධානය, මෙම ඥානයේ නිධානය සහ භෞතික ධනයේ නිධානය භාවිත කර එමඟින් කෝටි ගණන් ආදායමක් රැස් කර ගන්න. මන්ද, මේ අවස්ථාවේ දී ඔබේ භෞතික ධනය පරමාත්ම දෙවියන්ට භාර දීමෙන්, එක් නව පයිසාවක (සතයක්) වටිනාකම මැණිකකට සමාන වේ. එබැවින්, සියලු නිධාන ඔබ වෙනුවෙන් සහ සේවය සඳහා භාවිතා කරන්න, එවිට ඔබ කෝටි ගණනින් වාසනාවන්ත වනු ඇත.

**පාඨය:** ඔබේ හදවතේ සෙනෙහස ඇති විට, සෑම කෙනෙකුගේම සහයෝගය පහසුවෙන් ලබා ගත හැකිය.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ජීව අවධාන ස්ථිතියේ රැඳී සිටීම පුහුණු කරන්න, අභ්‍යන්තරගත වන්න.**

**දැන් ඔබේ ශරීරයේ වාසය කරන ජීවාත්මය සෑම කෙනෙකුටම පැහැදිලිව දැකගත හැකි වන පරිදි විනිවිද පෙනෙන බවට පත් වන්න. ඔබේ ජීවාත්ම අවධාන ස්වරූපය ඔවුන්ට ඔවුන්ගේම ජීවාත්මයන්ගේ ස්වරූපය පිළිබඳ දර්ශනයක් ලබා දෙත්වා. මෙය අව්‍යක්ත හෝ ජීවාත්ම අවධානයේ අත්දැකීමක් ලබා දීම ලෙස හැඳින්වේ.**